**සීමාසහිත මිහින් ලංකා (පුද්ගලික) සමාගම - 2016/2017**

-----------------------------------------------------------------

2017 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ අලාභ ප්‍රකාශනය හා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සීමාසහිත මිහින් ලංකා (පුද්ගලික) සමාගමේ ("සමාගම") මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම**

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙළ කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණ කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ("අධ්‍යක්ෂ මණ්ඩලය") වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

----------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම් වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්වය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුලත් වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා අමා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2 මූල්‍ය ප්‍රකාශන

---------------

### 2.1 මතය

------

මූල්‍ය ප්‍රකාශනවලින්, 2017 මාර්තු 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

#### 2.1.1 අවධාරණය කළ යුතු කරුණු

-------------------------------

2016 ඔක්තෝබර් 30 දින සිට බල පැවැත්වෙන පරිදි සමාගමේ මෙහෙයුම් කටයුතු නතර කිරීමට ශ්‍රී ලංකා රජය විසින් ගන්නා ලද තීරණය විස්තර කෙරෙන මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 03 කෙරෙහි අවධානය යොමු කරමි. තවද, 2017 නොවැම්බර් 08 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි 2018 ජනවාරි 15 දින සමාගම ඈවර කිරීමේ පෙත්සමක් සහ තාවකාලික ඈවරකරුවකු පත්කිරීමේ පෙත්සමක් වාණිජ ඉහළ අධිකරණය වෙත ඉදිරිපත් කර තිබුණි. එබැවින්, මෙම මූල්‍ය ප්‍රකාශන කොටස් කරන ලද පදනමක් මත පිළියෙළ කර තිබුණි. මෙම කරුණ හේතුවෙන් මාගේ මතය තත්ත්වාගණනය කරනු නොලැබේ.

#### 2.1.2 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තාව

------------------------------------------------------------------

2007 අංක 07 දරන සමාගම් පනතේ 163(2) වගන්තියේ අවශ්‍යතාවය පරිදි පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

(අ) මතය සඳහා පදනම හා විෂය පථය සහ විගණනයේ සීමා කිරීම් ඉහත පරිදි දක්වනු ලැබේ.

(ආ) මාගේ මතය වනුයේ,

- විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු හා පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද බවත්, මගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සමාගම විසින් විධිමත් ගිණුම් වාර්තා පවත්වා ඇති බව සහ,
- සමාගමේ මූල්‍ය ප්‍රකාශන, 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියෙහි අවශ්‍යතාවයන්ට අනුකූල වන බව.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

----------------------------------------

#### 2.2.1 සමාගමේ අඛණ්ඩ පැවැත්ම

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළ සමාගම ලබා තිබූ රු. මිලියන 2,470 ක අලාභය සමඟ සමාලෝචිත වර්ෂය අවසාන වන විට සමාගම රු. මිලියන 19,743 ක සමුච්චිත අලාභයක් වාර්තා කර තිබුණි. තවද සමාගමේ ජංගම වගකීම් එහි ජංගම වත්කම් වලට වඩා රු. මිලියන 5,267 කින් ඉක්මවා තිබූ අතර, වාර්තාවේ දිනය වන විට සමාගමේ අහිතකර මූල්‍ය තත්ත්වය පෙන්නුම් කරමින් එහි හිමිකම රු. මිලියන 5,267 ක ඍණ අගයක් ගෙන තිබුණි.

(ආ) සමාගමේ මූල්‍ය තත්ත්වයේ තවදුරටත් සිදුවිය හැකි පාඩු හා පිරිහීම් මගහරවා ගැනීම සඳහා සමාගමේ මෙහෙයුම් කටයුතු 2016 ඔක්තෝබර් 30 දින සිට නතර කර දැමීමට ශ්‍රී ලංකා රජය තීරණයක් ගෙන තිබූ අතර දැනට සමාගම ක්‍රියාත්මක කරන මාර්ග ජාලය පවරා ගැනීමට ශ්‍රී ලන්කන් ගුවන් සමාගමට නියෝග කර තිබුණි. එම නිසා සමාගමේ මූල්‍ය ප්‍රකාශ කොටස් කරන ලද පදනමක් මත සකස් කර තිබුණි.

**2.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත (ශ්‍රීලංගිප්‍ර/ශ්‍රීලංමූවාප්‍ර)**

---------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූල්‍ය උපකරණ සඳහා වූ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති අංක 7 හි (SLRFS 7) 8 ඡේදය ප්‍රකාරව සෑම වර්ගයකටම අයත් මූල්‍ය වත්කම් හා වගකීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි හෝ මූල්‍ය ප්‍රකාශ සඳහා වූ සටහන්වල දැක්විය යුතුවේ. කෙසේ වුවද කෙටිකාලීන තැන්පතු සහ වගකීම් සම්බන්ධයෙන් එබඳු හෙළිදරව් කිරීම් කර නොතිබුණි.

(ආ) මුදල් ප්‍රවාහ ප්‍රකාශ සකස් කිරීම සඳහා වූ ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිති අංක 07 හි 20 (ආ) වගන්තිය අනුව, ඍජු ක්‍රමය යටතේ මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය සෙවීමේදී අස්පෘශ්‍ය වත්කම්වල හානිකරණ වියදම් (Impairment Expenses of Intangible Assets) මූල්‍ය ප්‍රකාශයෙහි මූල්‍ය නොවන වත්කම් ලෙස ගලපා නොතිබුණි.

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2017 මාර්තු 31 දිනට ලැබිය යුතු ශේෂ එකතුව රු. 196,273,498 ක් වූ අතර එයින් වර්ෂ 01 සිට වර්ෂ 06 දක්වා කාල පරිච්ඡේදයක් තුළ නිරවුල් කර නොතිබූ ශේෂය රු. 27,356,619 ක් විය. විස්තර පහත දී ඇත.

| ගනුදෙනුකරු | ශේෂය | ණය ලබාදුන් දිනය |
|---|---|---|
| ප්‍රධාන කාර්යාලීය විකුණුම් | 313,610 | 2015 දෙසැම්බර් |
| ගුවන්යානා බදු (Charter) ආදායම් | 363,000 | 2011 ඔක්තෝබර් |
| මිහින් ලංකා ගුවන් ටිකට් | 13,718,866 | 2012 අප්‍රේල් |
| Danat a Dubai | 1,985,875 | 2012 පෙබ/මාර්තු |
| බන්ඩූර් ඒවියේෂන් (Bandur Aviation) | 8,717,279 | 2014 අගෝ/සැප්. |
| වර්ල්ඩ් එයාර් (World Air) පුද්ගලික සමාගම | 2,257,989 | 2011 මාර්තු |

(ආ) මෙයට අමතරව සමස්ත ණය ගැතියන්ගෙන් සියයට 59 කට සමාන රු. මිලියන 115 ක්, අයකර නොගෙන දින 90 ට වැඩි කාලයක් ගතව තිබුණි.

## 2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

---------------------------------------------------------------------------

පහත සඳහන් නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම් අවස්ථා විගණනයේදී නිරීක්ෂණයන් විය.

| **නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වල යොමුව** | **අනුකූල නොවීම** |
|---|---|
| **(අ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාරවල යහපාලනය සඳහා වූ මාර්ගෝපදේශ පිළිබඳ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය** | |
| i) 4.2.6 වගන්තිය | චක්‍රලේඛයේ පළමු පරිශිෂ්ඨය මඟින් ලබාදී ඇති ආකෘති ප්‍රකාරව සකස් කරන ලද කාර්තුමය කාර්ය සාධන වාර්තා කාර්තුව අවසන් වී දින 30 ක් හෝ ඊට පෙර රේඛීය අමාත්‍යාංශයට හා මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු වේ. කෙසේ වුවද සමාගම එහි මෙහෙයුම් කටයුතු නතර කරන තෙක්ම එම වාර්තා සකස් කර හා ඉදිරිපත් කර නොතිබුණි. |
| ii) 7.3 ඡේදය | ටෙන්ඩර් පරිපාටි පිළිබඳ මාර්ගෝපදේශ සියලු රාජ්‍ය ව්‍යවසායයන් සඳහා අදාල කරගත යුතු වේ. කෙසේ වුවද, සමාගමේ ප්‍රසම්පාදන අත්පොත රේඛීය අමාත්‍යාංශය විසින් අනුමත කර නොතිබූ අතර ඒ සඳහා මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ, එකඟත්වය ලබා ගෙන නොතිබුණි. |
| iii) 7.4.5 ඡේදය | සමාගමේ වත්කම් සත්‍යාපනය සිදු කිරීම සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ සිදුකර නොතිබුණි. |
| iv) 9.2 (ඇ) ඡේදය | සමාගමේ සංවිධාන සටහන හා අනුමත සේවක සංඛ්‍යාව මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර නොතිබුණි. |
| v) 9.3.1. (i) ඡේදය | මහා භාණ්ඩාගාරයේ එකඟත්වය සහිතව අමාත්‍යාංශය විසින් සමාගමේ බඳවා ගැනීම් හා උසස්වීම් පරිපාටිය (SOR) අනුමත කර නොතිබුණි. |
| **(ආ) 2016 ඔක්තෝබර් 27 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පීඊඩී 1/2015 (1)** | රාජකාරි වාහනයක් සඳහා හිමිකම් ලබන නිලධාරියෙකුට රාජකාරි වාහනයක් භාවිතා කිරීමට හෝ මාසික දීමනාව ලෙස රු. 50,000 ක් ලබා ගැනීමට හැකිවේ. කෙසේ වුවද 2016/2017 වර්ෂය තුල සමාගම විසින් නිලධාරීන් 7 දෙනෙකුට චක්‍රලේඛයට පටහැනිව රු. 60,000 බැගින් ගෙවා තිබූ අතර වැඩිපුර ගෙවන ලද සමස්ථ මුදල රු. 840,000 ක් වී තිබුණි. තවද, සමාගම විසින් චක්‍රලේඛයට පටහැනිව එම නිලධාරීන් වෙනුවෙන් ගෙවන ලද රියදුරු දීමනාව රු. 1,680,000 ක් වී තිබුණි. |

| | |
|---|---|
| **(ඇ) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 7(i) වගන්තිය** | සමාගම විසින් ආයෝජන මණ්ඩලය සමඟ එළඹ තිබූ නිදහස් කිරීමේ ගිවිසුමකට අනුව සමාගම විසින් 2016/2017 (බ/ව) වර්ෂය සඳහා බදු ගණනයක් සිදුකර නොතිබුණි. කෙසේ වුවද 2015/2016 මූල්‍ය ප්‍රකාශ සඳහා වූ සටහන් අංක 6 මගින් දක්වා තිබූ පරිදි, 2006 අංක 10 දරන ආදායම් පනතේ 7(i) වගන්තිය පරිදි බදු සහනයක් සමාගම විසින් ලබාගෙන ඇති බව දක්වා තිබුණි. කෙසේ වුවද එබදු සහනයක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ලබාගෙන නොතිබුණි. |

## 3 මූල්‍ය සමාලෝචනය

----------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ සමාගමේ ශුද්ධ අලාභය රු. මිලියන 2,470 ක් වූ අතර පසුගිය වර්ෂයේදී ශුද්ධ අලාභය රු. මිලියන 1,252 ක් විය. මේ නිසා පසුගිය වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. මිලියන 1,218 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. මෙම පිරිහීම සඳහා මූල්‍ය පිරිවැය සියයට 185.51 කින් හෙවත් රු. මිලියන 567 කින් වැඩිවීම ප්‍රධාන හේතුව වී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී සමාගමේ මෙහෙයුම් කටයුතු නතර කිරීම නිසා මාස 7 ක් පමණක් ක්‍රියාත්මක වීම නිසා සමාගමේ සමස්ථ ආදායම සියයට 31.3 කින් අඩු වී තිබුණි.

(ආ) සමාගමේ සෘණ එකතු කල අගය 2012/13 සිට 2016/17 දක්වා රු. මිලියන 2,571 සිට රු. මිලියන 1,758 දක්වා වෙනස් වී තිබුණි. විස්තර පහත පරිදි වේ.

| **විස්තරය** | **2016/17 (රු. ´000)** | **2015/16 (රු. ´000)** | **2014/15 (රු. ´000)** | **2013/14 (රු. ´000)** | **2012/13 (රු. ´000)** |
|---|---|---|---|---|---|
| බදු පසු ලාභ / (අලාභ) (ලාභාංශ ගෙවීමට පෙර) | (2,469,730) | (1,251,947) | (1,406,483) | (2,591,539) | (3,291,475) |
| එකතු | | | | | |
| සේවක පරිශ්‍රාමික | 631,782 | 888,217 | 690,450 | 726,194 | 519,297 |
| ක්ෂය කිරීම | 67,897 | 13,278 | 5,869 | 4,683 | 6,891 |
| කපාහැරීම් (Amortization) | 11,657 | 42,414 | 44,690 | 34,779 | 15,590 |
| | (1,758,394) | (308,038) | (665,474) | (1,825,883) | (2,751,697) |

සමාලෝචිත වර්ෂයේ සමාගමේ බදු පසු සෘණ දායකත්වය රු. මිලියන 1,450 කින් වැඩි වී තිබූ අතර ක්ෂය හා කපාහැරීම් වැඩිවීම ඒ සඳහා හේතු වී තිබුණි. මූල්‍ය වියදම් රු. මිලියන 368 කින් වැඩිවීමේ ප්‍රතිඵලයක් ලෙස සමාලෝචිත වර්ෂය සඳහා බදු පසු අලාභය රු. මිලියන 1,218 කින් වැඩි වී තිබුණි.

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

-----------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය සඳහා දළ ලාභ ආන්තිකය සියයට (23.91) ක්ද, ශුද්ධ ලාභ ආන්තිකය සියයට (30.70) ක් ද සමස්ථ විස්තීරණ ලාභ ආන්තිකය (30.70) ක් වී තිබුණි. වියදම්වල සැලකිය යුතු වැඩිවීම සමාලෝචිත වර්ෂය තුළ දරන ලද ශුද්ධ පාඩුව සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

(ආ) සමාගමේ ශුද්ධ සෘණ අගය හේතුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ණය ස්කන්ධ අනුපාතය සියයට 152 ක සෘණ අගයක් ගෙන තිබුණි. සාමාන්‍ය ව්‍යාපාර කටයුතු වලදී ණය ගෙවා ගත නොහැකි බංකොලොත් භාවය හේතුවෙන් ණය හිමියන් සුරක්ෂිත නොවන බව එයින් දැක්වේ.

(ඇ) ජංගම අනුපාතය 0.34:1 වූයෙන් සමාගමේ අහිතකර ද්‍රවශීලතා තත්ත්වයක් එයින් නිරූපණය විය.

## 4 මෙහෙයුම් සමාලෝචනය

---------------------------

## 4.1 කාර්ය සාධනය

----------------

සමාගමේ සාංගමික සංස්ථා පත්‍රය අනුව, මූලික අරමුණු වනුයේ දේශීය හා ජාත්‍යන්තර ගුවන් සේවයක් හෝ ගුවන් ප්‍රවාහන කාර්යයක් ලෙස ව්‍යාපාර සිදු කිරීම සහ මගීන් හා නැව්බඩු සඳහා ගුවන් ප්‍රවාහන සේවා මෙහෙයුම් කිරීමයි. පසුගිය වර්ෂ 4 තුළ සමාගමේ ප්‍රධාන කාර්ය සාධන දර්ශක වල වෙනස්වීම් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ප්‍රධාන කාර්ය සාධන දර්ශක (KPIs) | 2015/16 | 2014/15 | 2013/14 | 2012/13 |
|---|---|---|---|---|
| මගී ධාරිතාවය (ASK මිලියන) | 1,822 | 1,675 | 1,850 | 1,395 |
| ගෙන යන ලද මගීන් (RPK මිලියන) | 1,363 | 1,216 | 1,404 | 1,050 |
| සමස්ත ධාරිතාවය (ATK මිලියන) | 208 | ඉදිරිපත් කර නොතිබුණි. | | |
| ගෙනයන ලද සමස්ත පැටවීම් ප්‍රමාණය (RTK මිලියන) | 148 | ඉදිරිපත් කර නොතිබුණි. | | |
| මගී පැටවීම් සාධකය (%) | 75 | 73 | 76 | 75 |
| ගෙනයන ලද මගීන් (දහස්වලින්) | 595 | 463 | 511 | 401 |
| ගෙනයන ලද නෞභාරය (ටොන්වලින්) | 4,764 | 3,435 | 3,134 | 2,504 |

ඉහත වගුව වනුව මගී ධාරිතාවය, මගීන් ගෙනයාම හා මගී පැටවුම් සාධකය පළමු වසර දෙක තුල වැඩි වී තිබී 2014/15 වර්ෂයේදී අඩුවී නැවත පූර්ව වර්ෂයේදී වැඩි වී තිබුණි. කෙසේ වුවද 2016/2017 වර්ෂයේ ක්‍රියාකාරීව පැවති මාස 07 තුල මගී ධාරිතාවය, මගීන් ගෙනයාම, මගී පැටවුම් සාධකය හා

භාණ්ඩ ප්‍රවාහනය පිළිබඳ ඇගයීම සඳහා සාක්ෂි ලබා ගැනීමට නොහැකි විය. තවද රජය විසින් ගන්නා ලද තීරණයක් මත සමාගමේ මෙහෙයුම් කටයුතු 2016 ඔක්තෝබර් 16 දින සිට නතර කර තිබුණි.

## 4.2 අයවැය ලේඛනමය පාලනය

-----------------------------

අයවැයගත සහ තථ්‍ය ආදායම හා වියදම අතර සැලකිය යුතු විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 4.3 මානව සම්පත් කළමනාකරණය

---------------------------------

2016 ඔක්තෝබර් 01 දිනට සමාගමේ මුළු සේවක සංඛ්‍යාව 302 ක් විය. සමාගමේ මෙහෙයුම් අත්හිටුවීමට ශ්‍රී ලංකා රජය විසින් ගන්නා ලද තීරණයෙන් පසුව, සමාගමේ සේවකයන් 125 දෙනෙකු ශ්‍රී ලන්කන් ගුවන් සමාගමට බඳවා ගෙන තිබුණි. සේවකයින් 168 දෙනෙකු ස්වේච්ඡාවෙන් විශ්‍රාම ගන්වන ලද අතර ඔවුන්ට ගෙවන ලද වන්දි මුදල් ප්‍රමාණය රු. මිලියන 165.22 ක් විය. තවද සේවකයන් දෙදෙනෙකු 2017 මාර්තු 31 දක්වා සමාගමේ සේවය කරමින් තිබුණි.

## 5 පද්ධති හා පාලන

-----------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු සමාගමේ සභාපතිගේ අවධානයට වරින්වර යොමු කරන ලදී. එහි සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

| පාලන ක්ෂේත්‍රය | | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) මානව සම්පත් කළමනාකරණය | – | සමාගමේ කාර්ය මණ්ඩල හා බඳවා ගැනීමේ පටිපාටිය, මහා භාණ්ඩාගාරයේ එකඟතාවය ලබාගෙන අදාල අමාත්‍යාංශය විසින් අනුමත කර නොතිබුණි. |
| (ආ) ගිණුම්කරණය | i) | ජර්නල් සටහන් අනුමත කිරීමේ ක්‍රියාවලිය සඳහා පාලන ක්‍රම නොමැති වීම. |
| | ii) | නොසැසඳූ ගිණුම් පිළිබඳ පාලන ක්‍රම නොමැති වීම. |
| | iii) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම. |
| (ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් | i) | ගමන් නියෝජිත (Travel Agent) ආයතන වලින් බැංකු සුරක්ෂණ නොමැති වීම. |
| | ii) | දිගුකාලීන ලැබිය යුතු හා ගෙවිය යුතු හිඟ මුදල් පැවතීම. |